# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

2025 වර්ෂයට අදාල අ.පො.ස.(උ.පෙළ) විභාගය 2025 නොවැම්බර් මස 10 දින සිට 2025 දෙසැම්බර් මස 05 දින දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ අනුව අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත පෞද්ගලික අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් මේ සමග ඉදිරිපත් කර ඇති අතර ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2025.07.21 වේ.

**මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (online) ක්‍රමය මගින් පමණි.** අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය (www.doenets.lk) මගින්, හෝ මාර්ගගත විභාග වෙබ් අඩවිය (https://onlineexams.gov.lk/eic) මගින් හෝ දෙපාර්තමේන්තු ජංගම දුරකථන යෙදවුම ("DoE" mobile app) මගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර ඊට ඇතුළත් වී අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

මෙම විභාගයට පෞද්ගලික අයදුම්කරුවකු ලෙස පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2025 ජූනි 26 වන දින සිට ජූලි 21 වන දින මධ්‍යම රාත්‍රී 12.00 පැය දක්වා භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් ම හොඳින් කියවා අවබෝධ කර ගෙන ඉහත වෙබ් අඩවියට පිවිස තම අයදුම්පත මාර්ගගත ක්‍රමයට (online) සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත්‍රයේ විභාගයට පෙනී සිටීමට තෝරා ගත් **නගරය හා විෂයයන්** ඇතුළත් කිරීමේ දී නිවැරදිව ම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. උපරිම වශයෙන් ප්‍රධාන විෂයන් 03 ක් සඳහා පමණක් පෙනී සිටීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු ලැබේ. ඊට අමතරව අවශ්‍යතාව පරිදි විෂය අංක 12 - සාමාන්‍ය පොදු පරීක්ෂණයට හා විෂය අංක 13 - සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කළ හැකිය.

**විභාගයට අයදුම් කිරීම ප්‍රධාන අදියර දෙකකින් සිදු කළ යුතු ය.**

**I අදියර - තොරතුරු ඇතුළත් කර යොමු අංකය (Reference Number) ලබා ගැනීම.**

ඔබගේ පෞද්ගලික තොරතුරු, විභාගය පිළිබඳ තොරතුරු හා විෂයයන් පිළිබඳ තොරතුරු හා ගෙවීම් ක්‍රමය පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න. ඔබ තැපැල් කාර්යාලයක් මගින් ගෙවීම් සිදු කරන්නේ නම් යොමු අංකය (Reference Number) ලබා ගත යුතු ය.

**II අදියර- විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත (Download) කිරීම**

ඔබට ලැබී ඇති යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී විභාග ගාස්තු ගෙවීමෙන් පසුව ඔබට ලැබී ඇති කෙටි පණිවිඩයේ (SMS) ඇති සබැඳිය (link) සක්‍රිය කිරීමෙන් හෝ නැවත වෙබ් අඩවියට ඇතුළත් වීම මගින් ඔබට ලැබෙන පිටුවේ "Download AL 2025 Application" අයිකනය තේරීම (Click) මගින් ඔබගේ අයදුම්පත බාගත (Download) කර ගත හැක.

ඔබ බැංකු කාඩ්පතක් මගින් ගෙවීම් සිදු කරන විට ගෙවීම සාර්ථකව අවසන්වූ පසුව ඉහත අයිකනය මගින්ම අයදුම්පත බාගත (Download) කර ගත හැක.

**විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාලයක් මගින් හෝ ඕනෑම බැංකු කාඩ්පතක් මගින් සිදු කළ හැකිය.**

**02. අයදුම්පත් :**

**මාර්ගගත (online) ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි මුද්‍රිත පිටපතක් ලබා ගන්න. මුද්‍රිත පිටපත ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුය. (අවශ්‍ය වුවහොත් එය ඉදිරිපත් කිරීම සඳහා)**

**රජයේ පාසලක අධ්‍යාපනය ලබන අතරතුර පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට අයදුම් කිරීම හෝ පෙනී සිටීම සපුරා තහනම් වේ. එසේ කළහොත් විභාග ප්‍රතිඵල අවලංගු කොට ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.**

2.1 **පද්ධතියට ප්‍රවේශ වීම - I අදියර**

i) අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,
- නිල වෙබ් අඩවිය (www.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Centre" මත Click කිරීම මගින් හෝ
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කිරීම මගින් හෝ
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.

ii) G.C.E. AL 2025 - Student Registration (Private) අයිකනය තේරීම මගින් පෞද්ගලික අයදුම්කරුවන්ට විභාගයට ඉල්ලුම් කිරීමට හැකි වේ.

iii) ඔබගේ පෞද්ගලික තොරතුරු, විභාගයට පෙනී සිටින නගරය, මාධ්‍යය ඇතුල් කිරීමෙන් හා තෝරා ගැනීමෙන් අනතුරුව ඔබ පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් තෝරාගෙන ඇතුළත් කළ යුතුය.

iv) (අ) **(13) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය ඃ**

ප්‍රධාන විෂයන් තුන සහ සාමාන්‍ය පොදු පරීක්ෂණයට අමතරව අයදුම්කරුවන්ට සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ද ඉල්ලුම් කළ හැකි ය. **සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ලබාගන්නා ප්‍රතිඵලය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ.** එහෙත් මෙම විෂය සඳහා ලබාගන්නා ශ්‍රේණිය අ.පො.ස.(උ.පෙළ) සහතිකයේ ඇතුළත් කරනු ලැබේ.

(ආ) **(12) සාමාන්‍ය පොදු පරීක්ෂණය ඃ**

යම් අයදුම්කරුවකු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන්නේ නම් ඔහු/ඇය මෙම විෂයයට පෙනී සිට අනිවාර්යයෙන් ම අවමය ලකුණු 30ක් ලබා ගත යුතු ය. **මීට පෙර අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට එක් අවස්ථාවකදී ලකුණු 30කට වඩා ලබා ඇත්නම් නැවත පෙනී සිටීම අනිවාර්ය නොවේ.**

(ඇ) **ප්‍රායෝගික පරීක්ෂණ සහිත විෂයයන් ඃ**

විෂය අංක 28, 52, 53, 54, 55, 56, 57, 58, 59, 65 හා 66 යන විෂයයන් සඳහා ලිඛිත පරීක්ෂණයන්ට ඉදිරිපත් වන සියලු ම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත සහ ප්‍රායෝගික යන කොටස් දෙකට ම ඉදිරිපත් වන අපේක්ෂකයින්ට පමණක් උක්ත විෂයන්වල ප්‍රතිඵල නිකුත් කරනු ඇත.

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් වෙත ලබා දෙන ප්‍රවේශ පත්‍රයේ සඳහන් දිනයේදී ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. එම දිනයේදී ඉදිරිපත් වීමට නොහැකි වූ අයදුම්කරුවන්ට වෙනත් දිනකදී ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණ සම්පූර්ණයෙන් අවසන්වූ පසු නැවත වතාවක් ප්‍රායෝගික පරීක්ෂණ නොපැවැත්වේ.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2016/13 හා 2016.04.26 දිනැති චක්‍රලේඛයට අනුකූලව විෂයයන් තෝරා ගත යුතුයි. එම චක්‍රලේඛයේ සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත් විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවලදී අයදුම්කරුවන් " නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන (Non Stream)" යනුවෙන් හඳුන්වා දෙන අතර එම අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී දිවයින් තරාව (Island Rank) හා දිස්ත්‍රික් තරාව (District Rank) නිකුත් කරනු නොලැබේ. එම චක්‍රලේඛයට පටහැනිව විෂය සංකලන තෝරා ගැනීමෙන් අයදුම්කරුවන්ට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා පිළිබඳ ව මෙම දෙපාර්තමේන්තුවට වගකීමක් නොමැති බව කරුණාවෙන් සලකන්න.

2.2 2025.07.21 වැනි දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක. **නියමිත දින රාත්‍රී 12.00 පැයෙන් පසු මාර්ගගත ප්‍රවේශය වසා තබනු ලැබේ.**

2.3 **එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. තොරතුරු වෙනස් කර අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී ඔහුගේ/ඇයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුව දඬුවම් කරනු ලැබේ.**

03. **විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත** (Download) **කිරීම - II අදියර**

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (Credit/Debit payment) මගින් සිදු කළ හැකිය.

3.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment Method" යටතේ ඇති "Pay by Postal Department" සබැඳිය තෝරා ගත යුතු ය. එහිදී ඔබට **ලැබෙන යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී ඔබගේ විභාග ගාස්තු ගෙවා** ලබා ගන්නා කුවිතාන්සිය ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.

මුදල් ගෙවීමෙන් පසු විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිස ඔබගේ අයදුම්පත්‍රය බාගත (Download) කර ගත හැකි වේ.

**ගෙවීම සාර්ථක වූ පසු ඔබට ලැබෙන කෙටි පණිවිඩයේ ඇති සබැඳිය** (link) **සක්‍රිය කිරීම මගින් අදාළ වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත** (Download) **කර ගැනීමට හැකි වේ.**

3.2 බැංකු කාඩ්පත් (Credit/Debit cards) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/ debit card" අයිතමය තෝරා ගත යුතුය.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

04. ඔබගේ අයදුම්පතේ තොරතුරුවලට අනුව විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරියේදී ඔබ වෙත ලැබෙනු ඇත. විභාග ප්‍රවේශ පත්‍රයේ කිසියම් සංශෝධනයක් අපේක්ෂා කරන්නේ නම් විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු පසු විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස දින හතක් (07) ඇතුළත අදාළ සංශෝධන සිදු කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

05. ඔබ ඉදිරිපත් කරන අයදුම්පතෙහි සඳහන් තොරතුරු හා විභාගයට පෙනී සිටීමට ඔබට ලැබෙන ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් තොරතුරු අතර පරස්පර විරෝධතාවක් තිබේ නම් ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහා ම පහත දුරකථන අංක මගින් විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව ඇමතිය යුතු ය.

06. **සෑම පෞද්ගලික අයදුම්කරුවෙක්ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය හා දුරකථන අංකය ඇතුළත් කළ යුතු අතර අධ්‍යාපනය ලබන පෞද්ගලික / ජාත්‍යන්තර පාසල් හෝ පෞද්ගලික ආයතන වශයෙන් පවතින පාසල්වල නම සහ ලිපිනය හෝ දුරකථන අංකය ඇතුළත් නොකළ යුතු ය.**

07. **අනන්‍යතාව ඔප්පු කිරීම**

විභාගයට පෙනී සිටීමේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ජාතික හැඳුනුම්පතක් මෙතෙක් ලබා නොමැති අයදුම්කරුවකු වේ නම් ඒ සඳහා ග්‍රාම නිලධාරී මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත අයදුම්පතක් නොපමාව ඉදිරිපත් කර තම ජාතික හැඳුනුම් පත සකස් කර ගත යුතු ය.

**සැ.යු. :-**
**මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාව වන විට ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවන් විභාග දෙපාර්තමේන්තුවට පැමිණ අප විසින් නිකුත් කරනු ලබන තාවකාලික අනන්‍යතා අංකයක් ලබා ගැනීම අනිවාර්ය වේ. ඒ වෙනුවට වෙනත් බාහිර පුද්ගලයින්ගේ හැඳුනුම්පත් අංක භාවිතා කිරීම සපුරා තහනම් වන අතර එය ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වීමට හේතුවකි.**

08. මෙම විභාගය සඳහා රජයේ පාසල්වලින්, ගාස්තු අයකරන / නොකරන රජය අනුමත පෞද්ගලික පාසල්වලින් සහ අනුමත පිරිවෙන්වලින් පළමු වරට සහ දෙවන වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් හැර අනෙකුත් සියලු ම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එසේ ගාස්තු ගෙවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මෙම විභාගය සඳහා අයදුම්කරනු ලබන **විශේෂ අධ්‍යාපන අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම් candidates with special education needs යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

**සටහන : මෙම විභාගය සඳහා** ගෙවන ලද විභාග ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

**මෙම විභාගයට අයදුම් කිරීමෙන් අනතුරුව එක ප්‍රශ්න පත්‍රයක කොටසකට හෝ පෙනී නොසිටි අපේක්ෂකයින් පමණක් විභාගයට පෙනී නොසිටි අපේක්ෂකයින් සේ සලකනු ලැබේ. එවැනි අපේක්ෂකයන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපාන විභාග වාරය අවලංගු නොවන බැවින්, ඒ සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම කිසිසේත් ම අවශ්‍ය නොවේ. කිසිදු විෂයකට පෙනී නොසිටි බව ඔප්පු කිරීමට ඇති එක ම සාක්ෂිය වන්නේ තමන් වෙත නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ආරක්ෂා සහිතව තබා ගැනීම පමණි. ඒ සම්බන්ධයෙන් වෛද්‍ය සහතික හෝ වෙනත් ඉල්ලීම් මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.**

උක්ත කරුණු සම්බන්ධයෙන් යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.


දුරකථන අංක : 011-2784208 / 011-2784537 / 011-2786616
ෆැක්ස් අංක : 011-2784422
විද්‍යුත් තැපෑල : gcealexam@gmail.com


ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

යොමු අංකය : 6/3/AL/2025
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.
2025.06.26